# විදුදය රිට්ස්බරි අන්තර් පාසල් පිහිනුම් තරඟාවලිය 27 - 28 දෙදින

## පාසල් 130ක් නියෝජනයෙන් පිහිනුම් ක්‍රීඩකයන් 2500ක්




**සිලෝන් බිස්කට්ස් පුද්ගලික ආයතනයේ අලෙවි කළමනාකරු නිලූපුල් ද සිල්වා විසින් විදුදය රිට්ස්බරි අන්තර් පාසල් පිහිනුම් තරඟාවලි අනුග්‍රාහක චෙක්පත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උප කුලපති මහාචාර්ය සම්පත් අමරතුංග වෙත ලබාදුන් අයුරු**

පිහිනුම් ක්‍රීඩකයන් 2500කට වැඩි සංඛ්‍යාවක් සහභාගී වීමට නියමිත විදුදය රිට්ස්බරි අන්තර් පාසල් පිහිනුම් තරඟාවලිය ජනවාරි 27-28 දෙදින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය පිහිනුම් තටාක සංකීර්ණයේදී පැවැත්වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ රිට්ස්බරි අනුග්‍රාහකත්වයෙන් පැවැත්වෙන මෙම තරඟාවලියට පාසල් 130කට වැඩි තරඟ 96ක් සහභාගී වේ. මීට අමතරව ජෝෂ්ඨ හා කනිෂ්ඨ සමස්ත ශූරතා කුසලානය සඳහා අවු. 9-11-13-15-17 හා 19න් පහළ වයස් කාණ්ඩ යටතේ රිලේ තරඟ 24ක් පැවැත්වීමට සංවිධායකයෝ අපේක්ෂා කරති.

සිලෝන් බිස්කට් ලිමිටඩ් (CBL) සමාගමේ රිට්ස්බරි මෙම පිහිනුම් තරඟාවලියට ප්‍රධාන අනුග්‍රහය ලබාදීම වෙනුවෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උප කුලපති මහාචාර්ය සම්පත් අමරතුංග ස්තුතිය පළ කරයි. පිහිනුම් ක්‍රීඩාව ශිෂ්‍යයන්ගේ සෞඛ්‍යය හා ශාරීරික යෝග්‍යතා මට්ටම වැඩිදියුණු කිරීමට වැදගත් වන අතර පාසල් සිසුන් වැඩි සංඛ්‍යාවක් සහභාගී වීම වඩාත් සාර්ථකත්වයට හේතුවක් වන බවද ඔහු ප්‍රකාශ කරයි.

සිලෝන් බිස්කට්ස් අලෙවි කළමනාකාර නිලූපුල් ද සිල්වා ක්‍රීඩකයන්ගේ දක්ෂතා ඉහළ නැංවීමට තම ආයතනය මෙවර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා සහයෝගීව එක්වන බවද මීට පෙර තම ආයතනය රිට්ස්බරි මගින් සර් ජෝන් ටාබට් මලල ක්‍රීඩා, කනිෂ්ඨ ජාතික ශූරතාවය, අන්තර්ජාතික පාසල් මලල ක්‍රීඩා තරඟාවලිය හා වෙළෙඳ සේවා මලල ක්‍රීඩා තරඟාවලිවලට අනුග්‍රාහකත්වය සපයා ඇති බවද ප්‍රකාශ කළේය.

ධම්මික